Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : පුරවැසි අධ්‍යාපනය

2 වාරය සතිය _ 12

ශ්‍රේණිය : 6

සකස් කිරීම : මාවනැල්ල කලාපය,

<u>පුණරීක්ෂණය</u>

- **අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

1) ඖෂධවේදය පිළිබඳ මෙරට ප්‍රථම මහාචාර්යවරයා වූයේ,
   1) C.W.W.කන්නන්ගර මහතාය
   2) සේනක බිබිලේ මහතාය
   3) නන්දදාස කෝදාගොඩ මහතාය
   4) කාලෝ ෆොන්සේකා මහතාය

2) පාසල තුළ හොඳ ඉගෙනුම් වාතාවරණයක් ඇති කිරීම සඳහා.
   1) ගොඩනැගිලි පද්ධතියක් අවශ්‍යය
   2) කාලසටහනක් අවශ්‍යය
   3) ගුරු මණ්ඩලයක් අවශ්‍යය
   4) නීති පද්ධතියක් අවශ්‍යය

3) යමක් පාසලට අයත් බව ඇඟවීම සඳහා භාවිතා කරනුයේ.
   1) පාසලේ ලාංඡනය
   2) පාසලේ ආදර්ශ පාඨය
   3) පාසල් කොඩිය
   4) පාසල් ගීතය

4) හොඳින් ඉගෙනීමේ කටයුතුවල නිරත වීම, විනය ගරුක වීම, නීති ගරුක වීම, සෙසු ළමුන් සමග සමානාත්මතාවයෙන් කටයුතු කිරීම ඔබ සතු ,
   1) අයිතියකි 2) හිමිකමකි 3) යුතුකමකි 4) නීතියකි

5) පහත සඳහන් කරුණු අතරින් පාසලෙන් සමාජයට සැපයෙන සේවා ඇතුළත් පිළිතුරට යටින් ඉරක් අඳින්න.
   A යහපත් පුරවැසියන් බිහිකිරීම
   B පාසල සතු දේපල ආරක්ෂා කිරීම
   C අනාගත නායකයන් බිහිකිරීම
   D පාසලේ සංවර්ධන කටයුතුවලට සහාය වීම

   1) AB 2) AC 3) BD 4) BC

6) ශ්‍රී ලංකාවේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පරිපාලන ඒකකය වනුයේ
   1) දිස්ත්‍රික්කය
   2) පළාත
   3) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
   4) ග්‍රාම නිලධාරී කොට්ඨාසය

7) බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක.
   1) දෙකකි 2) තුනකි 3) හතරකි 4) පහකි